සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# පළමු වාර පරීක්ෂණය 2019

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

**06 ශ්‍රේණිය** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- අංක 01 සිට 10 තෙක් වූ ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පරිගණකයක් යනු,
    (1) පද්ධතියකි. (2) යන්ත්‍රයකි.
    (3) විද්‍යුතයෙන් ක්‍රියා කරන්නකි. (4) ඉහත සඳහන් සියල්ලම වේ.

02. පරිගණක පද්ධතිය වෙත ඇතළත් කරන දෑ වන්නේ,
    (1) තොරතුරු (2) දත්ත (3) සංකේත (4) අකුරු

03. දත්ත තොරතුරු බවට පත්කරනුයේ ................................................................................. මගිනි.
    (1) ගණනය කිරීම (2) ගබඩාකරණය (3) සැකසීම (4) විශ්ලේෂණය

04. නිහිත පරිගණකයක් සඳහා උදාහරණයක් වන්නේ,
    (1) පුවත්පත (2) ගණකයන්ත්‍රය
    (3) රෙදිසෝදන යන්ත්‍රය (4) යතුරු ලියන යන්ත්‍රය

05. පරිගණක පද්ධතියක දත්ත හා තොරතුරු ගබඩාකරණ උපක්‍රමයන් හඳුන්වන්නේ,
    (1) ආචයක උපක්‍රම ලෙස ය. (2) ආදාන උපක්‍රම ලෙස ය.
    (3) සැකසීමේ උපක්‍රම ලෙස ය. (4) ප්‍රතිදාන උපක්‍රම ලෙස ය.

06. දත්ත සකස්කිරීමේ කාර්ය සිදුකරනු ලබන්නේ,
    (1) මොනිටරය මගිනි. (2) යතුරු පුවරුව මගිනි.
    (3) UPS මගිනි. (4) CPU මගිනි.

07. පරිගණකයක ප්‍රධාන හෙවත් ප්‍රාථමික මතක උපාංගය වන්නේ,
    (1) RAM (2) ROM (3) DVD (4) දෘඪතැටි Hard Disk

08. සන්නිවේදන උපාංගයක් ලෙස නම්කළ හැකි උපකරණය වන්නේ,
    (1) මූසිකය (2) රවුටරය (3) යතුරු පුවරුව (4) මොනිටරය

09. පරිගණකය තුළ ඇති විවිධ වැඩසටහන් උපදෙස් හඳුන්වන්නේ,
    (1) දෘඪාංග ලෙස ය. (2) ක්‍රමලේඛ ලෙස ය.
    (3) මෘදුකාංග ලෙස ය. (4) උපක්‍රමයක් ලෙස ය.

10. බැංකු පද්ධතිය තුළ ක්ෂණිකව මුදල් ලබාගැනීමේ පහසුව සලසා ඇති යන්ත්‍රය වන්නේ,
    (1) ATM යන්ත්‍රය. (2) CAT යන්ත්‍රය
    (3) කවුන්ටරය (4) මුදල් ගණනය කිරීමේ යන්ත්‍රය

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රකාශයන් සත්‍ය හෝ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි හෝ අසත්‍යය නම් (✗) ලකුණ ද යොදන්න.

11. ටැබ්ලට් පරිගණකය තුළ දත්ත ඇතුලත් කිරීම හා ප්‍රතිදානය යන ක්‍රියා දෙකම පරිගණක තිරය මගින් සිදු වේ. (.......)

12. ATM යන්ත්‍රය මගින් මුදල් ලබා ගැනීම මෙන්ම භාණ්ඩ හා සේවා සඳහා බිල්පත් ගෙවීම ද සිදුකළ හැකි ය. (.......)

13. පරිගණක විද්‍යාගාරය තුළ ඉතා ආරක්ෂිත විදුලි රැහැන් පද්ධතියක් පැවතීම ආරක්ෂාකාරී වේ. (.......)

14. UPS භාවිතය පරිගණකයේ දත්ත හා තොරතුරු ආරක්ෂා කරගැනීමට හා එහි කාර්යක්ෂම භාවයට හේතු නොවේ. (.......)

15. පද්ධති ඒකකය තුළ මවු පුවරුව පිහිටා ඇත. (.......)

- අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු දී ඇති පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

පද ලැයිස්තුව - shut down / password / රොබෝ / Folders / CCTV

16. කර්මාන්ත ශාලාවල වැඩි කාර්යක්ෂමතාවය සඳහා ........................................ යොදා ගනී.
17. ලිපිගොනු ආරක්ෂා කිරීමේ ක්‍රමයක් ලෙස ........................................ භාවිතා කළ හැකි ය.
18. පරිගණකයේ ක්‍රියාකාරිත්වය නතර කිරීම ........................................ වේ.
19. අප විසින් පරිගණකයේ නිර්මාණය කරන විවිධ ලිපි ........................................ තුළ ගබඩා කරයි.
20. ආකෝෂිත ක්‍රමඋපායක් ලෙස බහුලව භාවිතා කරන උපකරණයක් ලෙස ........................................ දැක්විය හැකිය.

(ල. 40)

## II කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 12ක් ලැබේ.

01 A දත්ත ඇතුළත් කරන උපාංගයන් ........................................ වේ.

දත්ත හා තොරතුරු පිටතට ලබාදෙන උපාංගයන් ........................................ වේ.

දත්ත හා තොරතුරු ගබඩාකරන උපාංග ........................................ වේ.

B පහත වගුව සම්පූර්ණ කරන්න.

| ආදාන උපාංග | ප්‍රතිදාන උපාංග | ආචයන උපාංග |
|---|---|---|
| 1. .................... | 4. .................... | 7. .................... |
| 2. .................... | 5. .................... | 8. .................... |
| 3. .................... | 6. .................... | 9. .................... |

02 (1) පරිගණකයේ සුවිශේෂී ලක්ෂණ 4ක් නම් කරන්න.

(2) පරිගණකය එදිනෙදා ජීවිතයේ භාවිතා කරනු ලබන අවස්ථා හතරක් නම් කරන්න.

(3) පරිගණකය භාවිතයෙන් සිදුකරගත හැකි විවිධ කටයුතු හතරක් නම් කරන්න.

03 (1) නිහිත පරිගණක යනු කුමක් ද?

(2) නිහිත පරිගණක සඳහා උදාහරණ තුනක් ලියන්න.

(3) රෝහල තුළ පරිගණක පද්ධතිය භාවිතා කරන අවස්ථාවන් තුනක් ලියන්න.


(4) පාසල තුළ පරිගණකය උපයෝගී කරගෙන සිදුකළ හැකි දෑ හෙවත් භාවිතයන් 3ක් ලියන්න.

04 (i) පරිගණක විද්‍යාගාරය තුළ උපාංගවල ආරක්ෂාව සඳහා ගතහැකි ක්‍රියාමාර්ග 3ක් නම් කරන්න.

(ii) පරිගණක විද්‍යාගාරය තුළ ඔබගේ හා දත්ත තොරතුරුවල ආරක්ෂාවට ගතහැකි ක්‍රියාමාර්ග 3ක් නම් කරන්න.

(iii) පරිගණකයක් නිවැරදි ව On කරන ආකාරය පියවර ලෙස ලියා දක්වන්න.

05 පහත දැක්වෙන රූපසටහනේ පරිගණක උපාංගයන් නම් කරන්න.




1. ........................................ 2. ........................................

3. ........................................ 4. ........................................

5. ........................................ 6. ........................................